# 2025-01-20 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීම

2019 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල මත බඳවා ගත් මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පළමු වෛද්‍ය ශිෂ්‍ය කණ්ඩායම 2025 ජූලි මස දී රෝහල් පාදක සායනික පුහුණුව ආරම්භ කිරීමට නියමිතව ඇත. දකුණු ආසියානු තාක්ෂණ හා වෛද්‍ය ආයතන පරිශ්‍රයේ (SAITM) පවතින පහසුකම් භාවිත කරමින් මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීමට සහ වෛද්‍ය සිසුන්ගේ රෝහල් පාදක පුහුණු කටයුතු සඳහා වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු රෝහලේ පහසුකම් භාවිත කිරීමට මීට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ. එහෙත්, එම රෝහලේ ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාව හා ඔවුන්ගේ රෝග විවිධත්වය ප්‍රමාණවත් නොවීම සහ රෝහල් කාර්යමණ්ඩලයේ හා විශේෂඥ වෛද්‍යවරුන්ගේ පවතින හිඟය හේතුවෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය සිසුන්ගේ සායනික මහාචාර්ය ඒකක පුහුණුවීම් සඳහා වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු රෝහල භාවිත කිරීම ගැටලු සහගත බව පෙනී ගොස් ඇත. එබැවින්, එම වෛද්‍ය සිසුන් හට ගුණාත්මක රෝහල් පාදක පුහුණුවක් ලබා දීම තහවුරු කිරීම සඳහා කළුතර ශික්ෂණ රෝහල හා ගල්ලස්ස මාතෘ හා ළමා රෝහල යොදා ගැනීමටත්, මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීම සඳහා කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාගොඩ බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් කොටස් 02ක් එම විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමටත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය; සහ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 02. ශ්‍රී ලංකා රජය සහ ඉතාලි රජය අතර ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුම

දෙරට අතර ද්විපාර්ශ්වික ගුවන් සේවා කටයුතුවලට අදාළ පියවර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය සහ ඉතාලි රජය සාකච්ඡා පවත්වා ඇති අතර, ඒ අනුව දෙරට අතර ගුවන් සේවා ගිවිසුමක් අත්සන් තැබීම සඳහා 2018-07-24 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එහෙත්, එකී ගිවිසුමට මෙතෙක් අත්සන් තබා නොමැති අතර, කඩිනමින් එකී ගිවිසුමට එළඹීමේ යෝග්‍යතාව දෙපාර්ශ්වය විසින් හඳුනාගනු ලැබ තිබේ. යෝජිත ගිවිසුම යටතේ ඕනෑම වර්ගයක ගුවන්යානයක් උපයෝගී කර ගනිමින් එකහතාවකට පැමිණි ගුවන් මාර්ග ඔස්සේ ගුවන් මගී සේවා සඳහා සතියකට නිශ්චිත කාලසටහන්ගත ගුවන් ගමන්වාර 14ක් දක්වා සහ

ගුවනින් භාණ්ඩ ප්‍රවාහන සේවා සඳහා සතියකට නිශ්චිත කාලසටහන්ගත ගුවන් ගමන්වාර 07ක් දක්වා පවත්වා ගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකා රජය සහ ඉතාලි රජය අතර එකී ගුවන් සේවා ගිවිසුම අත්සන් තැබීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **කැලණිවැලි දුම්රිය මාර්ග රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන් ප්‍රතිස්ථාපනය කිරීම**

කොළඹ නදාසන්න දුම්රිය මාර්ග ව්‍යාපෘතිය යටතේ මාළිගාවත්ත ලොකෝ මංසන්ධියේ සිට පාදුක්ක දුම්රිය ස්ථානය දක්වා දුම්රිය මාර්ග රක්ෂිතය තුළ අනවසර පදිංචිකරුවන්හට නිවාස හෝ වන්දි හෝ ලබා දී ප්‍රතිස්ථාපනය කිරීම සඳහා 2024-08-05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරියට අයත් නිවාස සංකීර්ණවලින් මිල දී ගත් නිවාස ඒකක 694ක පදිංචි කිරීම් මේ වන විටත් අවසන් කර ඇති අතර, තවත් නිවාස ඒකක 144ක් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබීමට නියමිතව ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස යෝජනා ක්‍රම නොමැති මහරගම, හෝමාගම හා පාදුක්ක යන ප්‍රදේශවල අනවසර පදිංචිකරුවන් නැවත පදිංචි කිරීම සඳහා කොට්ටාව මාලපල්ල ප්‍රදේශයේ දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩමක නිවාස ඒකක 120ක නිවාස සංකීර්ණයක් ඉදිකරමින් පවතින අතර, එහි වැඩ කටයුතු මේ වන විට නිම වෙමින් පවතී. ඒ අනුව, එකී නිවාස සංකීර්ණයේ පදිංචි කිරීමට නියමිත ප්‍රතිලාභීන්හට ඔප්පු ලබා දීමට හැකි වන පරිදි ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් කොට්ටාව මාලපල්ල හි පිහිටි ඉඩම සහ ඒ තුළ පිහිටි නිවාස සංකීර්ණය රජයේ ඉඩම් ආඥාපනතේ 6(1) වගන්තියෙහි විධිවිධාන පරිදි නිදහස් දීමනාවක් වශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා දීමටත්, තෝරාගනු ලබන ප්‍රතිලාභීන්ට මූල්‍ය බරක් නොවන පරිදි අදාළ ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමටත් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ IHE-Delft Institute for Water Education මගින් ප්‍රජා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ඒකාබද්ධ පර්යේෂණ හා සංවර්ධන සහ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා UNESCO IHE ආයතනය සමඟ 2022 වර්ෂයේදී අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේ. එකී අවබෝධතා ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් "පාර්ශ්වකරුවන් ජල සේවා කොටස් හිමියන් බවට

පරිවර්තනය කිරීම පිණිස ප්‍රජා වගකීම් කළමනාකරණය" යන තේමාව යටතේ ජලය සහ සෞඛ්‍ය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් විස්තීරණ ව්‍යාපෘති යෝජනාවක් IHE-Delft Institute for Water Education ආයතනය වෙත ඉදිරිපත් කර ඇත. එම ආයතනය විසින් IHE-Delft ජල හා සංවර්ධන හවුල්කාරිත්ව වැඩසටහනේ 3වන අදියර (DUPC 3) යටතේ ව්‍යාපෘති යෝජනාව හවුල්කාර සාමාජික ආයතන කිහිපයක් සමග එක්ව ක්‍රියාත්මක කිරීම පිණිස අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, හවුල්කාර සාමාජිකයින් සඳහා යුරෝ 399,819ක උපරිම ප්‍රදාන දායකත්වයක් ලබා දීමටත්, ඉන් යුරෝ 164,236ක මුදලක් ජල හා සංවර්ධන හවුල්කාරිත්ව වැඩසටහනේ 3වන අදියර (DUPC 3) යටතේ ශ්‍රී ලංකා රජය වෙත වෙන් කර දීමටත් එකඟතාව පළ කර ඇත. යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස අදාළ ගිවිසුම්වලට එළඹීම සඳහා නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. තෝරාගත් පාසල් සිසුන්, පිරිවෙන්වල ගිහිපැවිදි සිසුන් හා සීලමාතාවන් සඳහා පාසල් පාවහන් යුගලක් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2025**

2015 වර්ෂයේ සිට තෝරාගත් පාසල් සිසුන් සඳහා පාසල් පාවහන් යුගලක් ලබා දීමේ වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර ඇති අතර, 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා තෝරාගත් පිරිවෙන්වල ගිහිපැවිදි සිසුන් හා සීලමාතාවන් ද එම වැඩසටහන යටතට ඇතුළත් කර ගනු ලැබ ඇත. 2025 වර්ෂය සඳහා එකී වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පත් කරන ලද නිලධාරි කමිටුවක නිර්දේශ මත පදනම්ව පහත සඳහන් පරිදි පාසල් සිසුන්, පිරිවෙන්වල ගිහිපැවිදි සිසුන් හා සීලමාතාවන් සඳහා පාවහන් මිල දී ගැනීමට රුපියල් 3,000/- බැගින් කිළිණ පතක් ලබා දීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අධ්‍යාපන අමාත්‍යතුමිය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

- සිසුන් 250ට අඩු පාසල් 6,000ක ඉගෙනුම ලබන සිසුන් 650,000ක් සඳහා.
- සිසුන් සංඛ්‍යාව 250ට අඩු පාසල් කාණ්ඩයට අයත් නොවන දිවයින පුරා පිහිටි වතු පාසල්වල සිසුන් 140,000ක් සඳහා.
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන් ඉගෙනුම ලබන පාසල් 28ක සිසුන් 2,300ක් සඳහා.
- පිරිවෙන්වල ඉගෙනුම ලබන තෝරාගත් ගිහිපැවිදි පිරිවෙන් සිසුන් 30,000ක් සඳහා.

06. **පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීමේ රජයේ පෝෂණ වැඩසටහන 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම**

මේ වන විට සියලුම රජයේ පාසල්වල 1-5 ශ්‍රේණිවල සිසුන්, ශිෂ්‍ය සංඛ්‍යාව 100ට අඩු පාසල්වල සියලුම සිසුන්, විශේෂ අධ්‍යාපන ඒකක හෝ පාසල්වල සිසුන් සහ තෝරාගත් පිරිවෙන්වල ගිහි සිසුන් ඇතුළු සමස්ත සිසුන් මිලියන 1.4ක් ආවරණය වන පරිදි දිවයිනේ අධ්‍යාපන කලාප 100ට අයත් පාසල් 8,956ක "පාසල් ආහාර වැඩසටහන" ක්‍රියාත්මක කරනු ලබයි. එම වැඩසටහන වඩාත් සැලසුම් සහගතව 2025 වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාත්මක කිරීමටත්, වාර්ෂිකව මුළු ශිෂ්‍ය සංඛ්‍යාව මිලියන 1.5ක උපරිමයට යටත්ව ප්‍රතිලාභ සලසා දීමට හැකි වන පරිදි අයවැය ප්‍රතිපාදන සලසා ගැනීමටත් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ අදියර II හි බටහිර බහාළු පර්යන්ත II සඳහා බටහිර දියකඩනය දීර්ඝ කිරීමේ සවිස්තරාත්මක සැලසුම් මෙහෙයවීම සඳහා උපදේශක සේවාව**

කොළඹ වරාය පුළුල් කිරීමේ අදියර II හි බටහිර බහාළු පර්යන්තය II සඳහා බටහිර දියකඩනය දීර්ඝ කිරීමේ සවිස්තරාත්මක සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිණිස 2023-06-26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඊට අදාළ උපදේශක සේවාව සඳහා තාක්ෂණික සහ මූල්‍ය සහාය ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව විසින් කැමැත්ත පළ කර ඇති අතර, ආසියානු සංවර්ධන බැංකුවේ නිර්ණායකයන්ට අනුකූලව අභිලාෂය ප්‍රකාශ කිරීම කැඳවා තිබේ. අයදුම්කරුවන් 20දෙනෙකු ඒ සඳහා සිය අභිලාශ ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කර ඇති අතර, 07 දෙනෙකු පූර්ව සුදුසුකම් සපුරා ඇත. ඒ අතුරින් ආයතන 05ක් සවිස්තරාත්මක යෝජනා ඉදිරිපත් කර තිබේ. තාක්ෂණික පිරිවිතර සපුරන ලද ආයතන 03ක මූල්‍ය යෝජනා ඇගයීමට ලක් කිරීමෙන් අනතුරුව අදාළ උපදේශක සේවා කොන්ත්‍රාත්තුව M/s. Dohwa Engineering Co. Ltd. වෙත පිරිනැමීම අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශක ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ ඇත. ඒ අනුව, එකී කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත**

අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත සකස් කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා 2024-12-09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද පනත් කෙටුම්පතට නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් පත් කිරීම**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරය 2025-01-01 දින සිට පුරප්පාඩුව පවතී. ශ්‍රී ලංකා යුධ හමුදාවේ විශ්‍රාමික මේජර් ජෙනරාල් කේ.එච්.පී.පාලිත ප්‍රනාන්දු මහතා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කිරීම සුදුසු බවට හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, ඒ මහතා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට වහාම ක්‍රියාත්මක වන පරිදි කොන්ත්‍රාත් පදනම මත එක් (01) වසරක කාලයක් සඳහා පත් කිරීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **ඉඩම් කොමසාරිස් ජනරාල් තනතුරට පත් කිරීම**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ඉඩම්) ලෙස සේවයේ නියුතු, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන, ඩී.ඩී.කේ.වික්‍රමආරච්චි මහතා, ඔහුගේ නිත්‍ය තනතුරට අමතරව 2024-12-12 දින සිට ඉඩම් කොමසාරිස් ජනරාල් තනතුරේ වැඩ බැලීම සඳහා පත් කරනු ලැබ ඇත. එම දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාව මත, ප්‍රාදේශීය පරිපාලනයේ අත්දැකීම් බහුල නිලධාරියෙකු ස්ථිරව පත් කර ගැනීමට අවශ්‍ය වී තිබේ. ඒ අනුව, දැනට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයේ අතිරේක ලේකම් (පාලන) ලෙස සේවයේ නියුතු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි, ආර්.ඒ. චන්දන සමන් රණවීර ආරච්චි මහතා, ඉඩම් කොමසාරිස් ජනරාල් ලෙස පත් කිරීමට සුදුසු බව හඳුනා ගනු ලැබ ඇත. ඒ මහතා ඉඩම් කොමසාරිස් ජනරාල් ලෙස පත් කිරීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම**

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් දැනට සේවයේ නියුතු කේ.එන්.එස්.රණතුංග මහත්මිය 2025-01-21 දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමට නියමිත බැවින්, එදින සිට පුරප්පාඩු වන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නව නිලධාරියෙකු පත් කළ යුතුව ඇත. එම තනතුර සඳහා දැනට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) තනතුරෙහි සේවය කරනු ලබන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනී ආචාර්ය ටී.ආර්.එස්.පී.එදිරිමාන්න මහත්මිය පත් කිරීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***********